# ධාරිතා වර්ධනය: ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ අත්දැකීම් ඇසුරින්



ශ්‍රී ලාංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානයන්හි නියෝජිතයන් ව්‍යාපෘතියේ ප්‍රතිඵල නෙලාගැනීමේ වැඩමුළුවේ දී (2024)

## හැඳින්වීම

විවිධ සමාජ බලප්‍රදේශ හරහා පරිවර්තනීය වෙනසක් ඇති කිරීමෙහිලා කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යභාර්ය මගින් අවධාරණය කරනුයේ තීරණ ගැනීමේ ක්‍රියාවලි තුළ ඔවුන් සක්‍රීය ලෙස සම්බන්ධ වීමේ වැදගත්කමයි. කාන්තා අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන (මෙය මෙතැන් සිට කාන්තා සංවිධාන ලෙස හැඳින්වේ.)  විසින් ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම අභිවර්ධනය කිරීම පිණිස ඔවුන්ගේ පෘථුල අත්දැකීම් සහ දැනුම වාසි සහගත ලෙස යොදා ගනිමින් මෙකී වෙනස සඳහා උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරනු ලබයි. කාන්තා සංවිධානවලට ගැලපෙන සහාය ලබා දෙමින්, කාන්තා අයිතිවාසිකම් හා සම්බන්ධිත ගැටළු ඵලදායී අයුරින් විසඳීමට ඔවුන්ගේ ධාරිතාව ඉහළ නැංවීම අරමුණ කර ගනිමින් මෙකී ප්‍රයත්න වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය ස්ථාපිත කරන ලදි.

සංවිධානාත්මක කළමනාකරණය, මූල්‍ය ස්තිරසාරභාවය, සේවා සැපයීම, උද්දේශනය සහ ජාලකරණය වැනි විවිධ ක්ෂේත්‍ර ඇතුළත් වන සේ ධාරිතා වර්ධනය මගින් මෙකී සංවිධාන සඳහා අත්‍යවශ්‍ය පදනමක් සකස් කෙරිණ. ව්‍යාපෘතිය පුරාවටම, කාන්තා සංවිධාන විසින් සිදු කෙරුණු ව්‍යාපෘතීන්හි සැලසුම් තුළ සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී සහ අධීක්ෂණය කිරීමේ දී ස්ත්‍රීවාදී ප්‍රවේශ නිරන්තරයෙන් ඒකාබද්ධ කෙරිණ. ශ්‍රී ලාංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මගින් සපයනු ලැබූ ධාරිතා වර්ධන සහාය අතිශයින්ම ස්ත්‍රීවාදී සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා මූලධර්ම මත

පදනම් වූ අතර එහිදී නිරන්තරයෙන්ම 'හානියක් සිදු නොකිරීමේ' මූලධර්මය පිළිබඳව සැලකිලිමත් විය. සවිබල ගැන්වීම, සහභාගීත්වය සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් තුළ කාන්තා සංවිධානයන්හි නියෝජිතයන් ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් කාන්තා සංවිධාන ශක්තිමත් කිරීම මෙකී සහාය මගින් අරමුණු කෙරිණ. ධාරිතා වර්ධනය සඳහා සිදු කළ මැදිහත්වීම් තුළින් ස්ථිරසාරභාවය සහ අඛණ්ඩ සංවර්ධනය තහවුරු කරමින්, කාන්තා සංවිධාන විසින් සිදු කරන ලද මූලාරම්භයන් සංඛ්‍යාව සහ ඒවායේ ආකාර ශ්‍රී ලාංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් නිරීක්ෂණය කරමින් මෙකී සහාය මගින් ඇති කළ බලපෑම අධීක්ෂණය කරන ලදී. මෙම සාකල්‍යවාදී ප්‍රවේශය ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීමේ ව්‍යාපාරය තුළ අර්ථදායී සහ ස්ථිරසාරභාවයකින් යුතු වෙනසකට මග පාදමින් කාන්තා සංවිධානවල සඵලදායකත්වය ඉහළ නැංවීම පමණක් නොව සිය සංවිධාන තුළ ස්ත්‍රීවාදී මූලධර්ම සහ වටිනාකම් සහිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ද සිදු කරන ලදි.

එය ගතික, නැගී එන අවශ්‍යතා සහ අභියෝගවලට ප්‍රතිචාර දක්වන සුළු සහ අවිධිමත් වූ බැවින් පස් අවුරුදු ව්‍යාපෘතිය පුරාවට සපයන ලද ධාරිතා වර්ධනය වනාහී උපායමාර්ගික, සාධක මත පදනම් වූ සහ මනාව සංවිධිත වූ කාර්යයක් විය. ශ්‍රී ලාංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ පාර්ශ්වකාර කාන්තා සංවිධාන සේවය කරනු ලබන ප්‍රජාවන් වෙත, පැහැදිලි හා අනුපිළිවෙලින් සිදුවන උපාය මාර්ගික ප්‍රතිඵල සහිත සංවිධානය තුළ සිටින තැනැත්තන් බල ගැන්වෙන අයුරින් එමගින් කාන්තා සංවිධාන සවිබල ගැන්වීමට දායක විය. ස්ත්‍රීවාදී වටිනාකම් පිළිගනිමින්, කාන්තා සංවිධාන විසින් පරිවර්තනීය වෙනසක් සඳහා දායක වෙමින්, සහ ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව වැඩි දියුණු කරමින් කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ හඬ, කාරකත්වය සහ සවිබල ගැන්වීම වැඩි දියුණු කිරීම පිණිස ශක්තිමත්ව සහ වඩාත් සන්නද්ධව නැගී සිටින ලදි.

## පසුබිම

ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියට පූර්වයෙන්, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සහ කාන්තා සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම කෙරෙහි යොමු වූ විශේෂයෙන්ම ඒ සඳහාම වෙන් වුණු වැඩසටහන්[1] ක්‍රියාත්මක කරන ලද අතර කාන්තා සවිබල ගැන්වීම[2] සම්බන්ධයෙන් කටයුතු කිරීමට කාන්තා සංවිධානවල ධාරිතා වර්ධනය මෙන්ම කාන්තා සවිබල ගැන්වීමේ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් ද ඒවා කේන්ද්‍රගත විය. මෙම මූලික පියවරයන් ඔස්සේ ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය බොහෝ උගත් පාඩම්වලින් සන්නද්ධ වූ අතර උගත් සුවිශේෂී පාඩමක් වූයේ විවිධ තේමාවන් සහ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වැඩ කිරීම සඳහා කාන්තා සංවිධානවල ධාරිතාව ඉහළ නැංවීම වැදගත් වන බවත් එමගින් සේවා සැපයීම, උද්දේශනය සහ ජාලකරණ මුලපිරීම් වැඩිදියුණු කිරීමත් ය. මෙම ධාරිතා වර්ධනය මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම කෙරෙහි වන අඛණ්ඩ ප්‍රගතිය බල ගන්වමින්, දිගු කාලීන ස්ථිරසාරභාවය තහවුරු කෙරේ.

ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ප්‍රජා මට්ටමේ කාන්තා සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සහ ද්විපාර්ශ්වික ආයතන සමග සිදු කළ සමීප සාකච්ඡා කිරීම් වලින් අනාවරණය වූ කරුණ වූයේ ශ්‍රී ලංකාවේ කාන්තා සංවිධාන මුහුණ දෙන තීරණාත්මක සහ සහාග ප්‍රමුඛතා හා අභියෝග වන්නේ තාක්ෂණික විෂයයන් සහ

1 කැනේඩියානු රජය (GAC) මගින් අරමුදල් සැපයෙන ශක්ති ව්‍යාපෘතිය (Shakthi), Women Defining Peace ව්‍යාපෘතිය (WDP), කැනේඩියානු රජයේ පැහැදිලි ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා අංගයන් විසින් යහපාලනය සහ ආයතනික සංවර්ධන ව්‍යාපෘතිය (GISP) සඳහා අරමුදල් සැපයීය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් යුක්තිය ප්‍රවේශය සහ සමාජ ඒකාබද්ධ වැඩසටහන (SELAJSI) ක්‍රියාත්මක කෙරුණ අතර එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් වෘත්තීය සහ ආයතනික ධාරිතා සංවර්ධන වැඩසටහනට (SPICE) අරමුදල් සැපයීය.

2 ජයසුන්දර, ආර්. සහ තෙවරප්පෙරුම, යූ. (2019) ශ්‍රී ලංකාවේ කාන්තාවෝ: සමානාත්මතාව, ජයග්‍රහණ සහ සවිබල ගැන්වීම - ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ ශ්‍රී ලංකාවේ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ අවස්ථා විශ්ලේෂණයක් (ප්‍රකාශයට පත් නොකළ) කතුවරුන් විසින් පූර්වයෙන් සිදු කළ කටයුතු මත පදනම්ව ශ්‍රී ලාංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය වෙනුවෙන් මෙම ලිපිය ඉදිරිපත් කෙරේ.

විවිධ කාන්තා ගැටළු; කළමනාකරණය සහ නායකත්ව පුහුණුව; ලේඛනගත කිරීම සහ වාර්තා කිරීම; යෝජනා ලිවීම සහ අරමුදල් රැස් කිරීම; මූල්‍ය කළමනාකරණය; සහ ප්‍රතිඵල රාමු සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂිත දැනුම පිළිබඳ ධාරිතා වර්ධනය ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තා සවිබල ගැන්වීම වැඩි දියුණු කිරීම සඳහා වන අවශ්‍යතාවයයි. එමෙන්ම ඔවුන්ට ඒ හා සමාන සංවිධාන, පිහිටුවා ඇති කාන්තා සංවිධාන, සහ රජයේ සහ අනෙකුත් නිලධාරීන්ගෙන් ඉගෙන ගැනීමට සහ එකී ආයතන සහ තැනැත්තන් සමග තොරතුරු සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාව හඳුනාගන්නා ලදි. ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ හවුල්කාර කාන්තා සංවිධානයන්හි ධාරිතා වර්ධන අවශ්‍යතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම සඳහා පාදීය සමීක්ෂණයක් සහ ධාරිතා අවශ්‍යතා තක්සේරුවක් සිදු කර ධාරිතා වර්ධන සැලැස්මක් සකස් කරන ලදි.

### කාන්තා අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන සඳහා උපාය මාර්ගික ධාරිතාව වර්ධනයː අවශ්‍යතා තක්සේරු කිරීම සහ විසඳුම් සකස් කිරීම

ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මගින් එහි ආරම්භක අදියරේ දී සිදු කළ පාදීය සමීක්ෂණයක් සහ ධාරිතා අවශ්‍යතා තක්සේරුව මගින් කාන්තා සංවිධානවල ඔවුනගේ කාර්යයන්ට සහාය දැක්වීම පිණිස කාන්තා සංවිධානවල ධාරිතා වර්ධන අවශ්‍යතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දෙන ලදි. සමීක්ෂණයේ මූලික අරමුණ වූයේ ව්‍යාපෘතිය ආරම්භයේදී සංවර්ධනය කරන ලද කාර්ය සාධන මිනුම් රාමුවක් මත පදනම්ව ඔවුන් සමග ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය දක්වන සහයෝගිතාව අධීක්ෂණය කිරීම සහ නිරීක්ෂණය කිරීම සඳහා මිණුම් ප්‍රමිත දර්ශක ස්ථාපිත කරමින්, කාන්තා සංවිධානවල ධාරිතාව සහ ක්‍රියාකාරිත්වය ඇගයීම සිදු කිරීමයි. මීට අමතරව, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය තුළ කාන්තා සංවිධානවලට ගැලපෙන ධාරිතා වර්ධන සහාය ලබා දීම පිණිස ඔවුන්ගේ සුවිශේෂී ධාරිතා අවශ්‍යතා හඳුනා ගැනීම අවශ්‍යයෙන්ම කළ යුතු විය. එබැවින්, පාදීය සමීක්ෂණයට සමගාමීව පවත්වනු ලබන ධාරිතා අවශ්‍යතා තක්සේරුව, කාන්තා සංවිධානවල සුවිශේෂී අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ප්‍රතිචාරාත්මක ධාරිතා වර්ධන සැලැස්මක් සංවර්ධනය කිරීම සඳහා සහාය විය.

### ධාරිතා අවශ්‍යතා තක්සේරුවෙහි ප්‍රධාන අනාවරණː

බොහෝ කාන්තා සංවිධාන ප්‍රජාව තුළ කාන්තාවන්ගේ අවශ්‍යතා සහ උත්සුකතාවන් සහ මෙම ගැටලුවල බලපෑම පැහැදිලිව කියා පෑමට අයිතිවාසිකම් මත පදනම් වූ රාමුවක් භාවිත කළ නමුත්, මූල හේතු සහ ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයකින් බැලීමේ දී ව්‍යුහාත්මක කාරණා පිළිබඳ පවතින පැහැදිලිබව අඩු වීම කරණු කොට ගෙන ස්ත්‍රී පුරුෂ සාමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීම හා සම්බන්ධ ගැටලු හඳුනා ගැනීමේ දී බොහෝ විට අභියෝගවලට මුහුණ දෙන ලදි. මෙය නොසලකා, ප්‍රායෝගික ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අවශ්‍යතා සහ උපායමාර්ගික ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බැඳියාවන් අතර තුලනයක් ඇති කර ගනිමින්, ඔවුන්ගේ දශක ගණනාවක අත්දැකීම් සහ ප්‍රජාව සමඟ සමීප සම්බන්ධතාවල ප්‍රතිඵලයක් ලෙස සංවේදී මැදිහත්වීම් සිදු කර ඇත. කෙසේ වෙතත්, දිගු කාලීන ප්‍රතිඵලවලින් කෙටි කාලීන බලපෑම් වෙන්කර හඳුනා ගැනීමේ දී, ඔවුන්ගේ මැදිහත්වීම්වල වඩා සියුම් තාර්කයන් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ දී, ඔවුන්ගේ මැදිහත්වීම්වලට පාදක වූ උපකල්පන තාර්කිකව විශ්ලේෂණය කිරීමේ දී සහ ඔවුන්ගේ මැදිහත්වීම් මගින් වෙනසක් ඇති කිරීම සඳහා වන ක්‍රියාවලිය තුළ දී බොහෝ දෙනෙකු අසීරුතා අත්විඳින ලදි.

විවාහය සහ දික්කසාදය සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන්ගේ අයිතිවාසිකම්, නිදහස් වෙළඳ කලාප කාන්තාවන්ගේ කම්කරු අයිතිවාසිකම් සහ ගෘහස්ථ සේවිකාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කරන සංවිධාන වැනි කාන්තා සංවිධාන කිහිපයක් විකල්ප වශයෙන් මතු වී පෙනුණි. මෙම කාන්තා සංවිධාන විසින් ඔවුන්ගේ කේන්ද්‍රීය ප්‍රදේශ තුළ අදාළ ගැටලු සඵලදායී ලෙස ආමන්ත්‍රණය කරමින්, ප්‍රජා මට්ටමේ සිට ජාතික

මට්ටම දක්වා පැතිරුණ උද්දේශන මුලපිරීම් සිදු කර ඇත. කාන්තා සංවිධාන, පුළුල් න්‍යාය පත්‍ර සහිතව අවධානය සහ බලපෑම රඳා පවත්වා ගැනීමේ පවත්නා අභියෝග යන්ට මුහුණ දුන් අවස්ථාවල දී, සිය විශේෂිත ගැටළු ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වඩාත් පැහැදිලි උපාය මාර්ග ඉදිරිපත් කරන ලදි. කාන්තා අයිතිවාසිකම්වලට ප්‍රමුඛත්වය දී තිබිය දීත්, සමහර කාන්තා සංවිධානවලට මූලික ව්‍යුහාත්මක හේතූන් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ දී අසීරුතාවක් පැවති අතර සිය කාර්යයට බලපෑම් කරනු ලබන නීතිමය සහ ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳව දැනුවත්ව සිටිමින් අභියෝගවලට මුහුණ දෙන ලදි.

කාන්තා සංවිධාන දේශීය නීති සහ ජාත්‍යන්තර රාමු පිළිබඳ අවබෝධයක් පෙන්නුම් කළ අතර විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර සිටින අය, කාන්තා දේශපාලන සහභාගිත්වය ප්‍රවර්ධනය කරන අය සහ නිදහස් වෙළෙඳ කලාපවල කාන්තාවන්ගේ කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් පක්ෂව කථා කරන අය, ඔවුන් ක්‍රියාත්මක වන සමාජ-ආර්ථික සන්දර්භ තුළ පවතින පැහැදිලි අවබෝධයන් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, අනෙකුත් කාන්තා සංවිධාන විසින් බොහෝ විට කාන්තාවන්ගේ ප්‍රායෝගික අවශ්‍යතාවල පවතින ප්‍රත්‍යක්ෂ ස්ථායීතාව හේතුවෙන් වෙනස්වන සමාජ-දේශපාලන සන්දර්භයන් නොසලකා ස්ථාවර උපාය මාර්ග භාවිත කරන බව පෙනුණි.

සමහර කාන්තා සංවිධාන විසින් දැනුම්වත්ව සිටීමට සහ වෙනසක් සහ සංවිධානයේ දෘශ්‍යමානතාව (organizational visibility) සඳහා සාමූහිකව උද්දේශනය ලබා දීම උදෙසා ජාතික මට්ටමේ ජාලකරණයක වටිනාකම හඳුනාගන්නා විට දී, බොහෝ දෙනෙක් ජාල හරහා සහයෝගයෙන් කටයුතු කිරීම ගැන දැඩි සැකයක් පළ කරනු ලැබුවේ එමගින් සිය සංවිධානවලට ලැබුනේ සුළු පිළිගැනීමක් හෝ ප්‍රතිලාභයක් බවට ඔවුන් විශ්වාස කළ බැවිනි. රාජ්‍යය සමග වන සහයෝගීතාවය; නීත්‍යානුකූලභාවය සඳහා තීරණාත්මක ලෙස සලකනු ලැබුවද, එවැනි සහයෝගීතාවයන්හි සඵලතාවය වෙනස් වූ අතර, ස්වල්ප දෙනෙක් පමණක් නායකත්ව භූමිකාවන් සහ සක්‍රීය මැදිහත්වීම පවත්වා ගනිමින් සිය ජාල වර්ධනය කර ගැනීමට මූලාරම්භයන් ගන්නා ලදි.

මීට අමතරව, සමහර කාන්තා සංවිධාන තරුණ සාමාජිකයින් අතර නායකත්ව කුසලතා පුහුණු කිරීමේ අවශ්‍යතාව පිළිගත් නමුත් බල ගතිකයන් සමග අරගල කරමින් මෙම කාර්යය සඳහා කැපවිය. භාෂා බාධක සහ යෝජනා ලිවීමේ සහ මූල්‍ය කළමනාකරණයේ ප්‍රමාණවත් කුසලතා නොමැති වීම වැනි විවිධ සාධකවලට හේතු කාරක වූ අරමුදල් අත්කර ගැනීමේ අභියෝග බහුලව පැවතුණි.

### ධාරිතා වර්ධන සැලැස්ම:

පාර්ශ්වකාර කාන්තා සංවිධාන සමග වැඩිදියුණු කළ (එහි ස්ත්‍රීවාදී ප්‍රවේශයක්), ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියෙහි ධාරිතා වර්ධන සැලැස්ම, ධාරිතා අවශ්‍යතා තක්සේරුවෙහි අවධාරණය කර ඇති පරිද්දෙන් ඔවුන්ගේ විවිධ ප්‍රායෝගික සහ උපායමාර්ගික අවශ්‍යතා ආමන්ත්‍රණය කරන ලදි. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල වන: කාන්තා සංවිධානවල කළමනාකරණය සහ ස්තිරසාරභාවය වැඩිදියුණු කිරීම, සේවා සැපයීම සහ උද්දේශනය වැඩි දියුණු කිරීම, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදීතාවයකින් යුත් ප්‍රතිපත්ති,සහ නීතිමය හා සමාජීය වෙනසක් කෙරෙහි බලපෑම් කරනු ලබන කාන්තා අයිතිවාසිකම් වේදිකාවල, ජාලයන්හි සහ සන්ධානවල සඵදායීබව වැඩි කිරීම යනාදිය සමග මෙම සැලසුම ගැළපේ.

ධාරිතා වර්ධනය සැලැස්ම මගින් කාන්තා සංවිධානවල ධාරිතා වර්ධනය අවශ්‍යතා ආකාර දෙකක් ඔස්සේ ආමන්ත්‍රණය කරන ලදි: පළමුව, එක් එක් සංවිධානවලට සහාය ලබා දීම, සහ දෙවනුව, සාමූහික පුහුණුව හරහා කාන්තා සංවිධානවලින් සමන්විත කණ්ඩායම් සඳහා ධාරිතා වර්ධනය ලබා දීම වශයෙනි. ධාරිතා වර්ධන සැලැස්ම

මගින් කාන්තා සංවිධාන වෙත ධාරිතා වර්ධනය ලබා දීමේ දී සහාය දැක්වීමට විභව සම්පත් සහ සම්පත්දායක පුද්ගලයන් ද හඳුනාගන්නා ලදි. මෙම ව්‍යාපෘතිය මගින් කාන්තා සංවිධානවල ධාරිතා වර්ධන අවශ්‍යතා ආමන්ත්‍රණය කරමින් සහ කාන්තා සංවිධානවල ධාරිතා වර්ධනයට සහාය වීම සඳහා ප්‍රවීණයන් සහ විශේෂඥ සංවිධාන හඳුනා ගනිමින් සියලුම කාන්තා සංවිධාන සඳහා තනි ආයතන ධාරිතා වර්ධන සැලසුම් සහ ව්‍යාපෘතිය සඳහා ඒකාබද්ධ සැලැස්මක් වැඩි දියුණු කරන ලදි.

මෙම ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා ධාරිතා වර්ධන සැලැස්ම මගින් පුළුල් මාතෘකා පෙළක් ආවරණය කෙරුණි. මෙයට කාන්තාවන් සවිබල ගැන්වීමේ ස්ත්‍රීවාදී ප්‍රවේශ පිළිබඳ පදනම් මූලධර්ම ආශ්‍රිතව කාන්තා සංවිධානවල දැනුම වැඩි දියුණු කිරීම, සංකල්පීය ප්‍රවේශයන් සහ කාන්තා අයිතිවාසිකම් කටයුතුවල නැගී එන ප්‍රවණතා පිළිබඳ දේශන අන්තර්ගත විය. එමගින් ගැටළු විශ්ලේෂණය, සමාජ-ආර්ථික සහ සමාජ-දේශපාලන තක්සේරු කිරීම්, වෙනස් වීමේ න්‍යායන් (theories of change) අවබෝධ කර ගැනීම සඳහා වන ධාරිතා වැඩි දියුණු කර ගැනීම මෙන්ම යෝජනා සංවර්ධනය සඳහා තාක්ෂණික ලිවීමේ කුසලතා වර්ධනය කිරීම අරමුණ කෙරුණි.

නැවත සලකා බැලීම් සිදු කරමින්, කාන්තා සංවිධානවල දැක්ම, මෙහෙවර සහ අරමුණු විභවාත්මකව සංශෝධනය කරමින්, ආයතනික ප්‍රතිපත්තිමය ලේඛනවල වැඩි දියුණු කිරීම් සිදු කරමින් පරිපාලනමය, මානව සම්පත් සහ මූල්‍ය පද්ධති ඇතුළත් සඵලදායී කළමනාකරණ උපාය මාර්ග සහිතව වාර්ෂික කාර්ය සැලසුම් සමග ගැලපෙන අයුරින් උපාය මාර්ගික සැලසුම් සහ අරමුදල් රැස්කිරීමේ උපාය මාර්ග වැඩි දියුණු කිරීම මෙම සැලැස්ම මගින් ඊට අමතරව අවධාරණයට ලක් විය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ වින්දිතයන් හට උපකාර කිරීමේ දී අවශ්‍ය වන මූලික කුසලතා මෙන්ම කාන්තාවන් කෙරෙහි බලපානු ලබන ප්‍රතිපත්ති, නීති සහ ජාත්‍යන්තර නියෝග සම්බන්ධයෙන් වූ තාක්ෂණික දැනුම මෙම සැලැස්ම මගින් ආමන්ත්‍රණය කෙරිණි. උපදේශනය සඳහා වන ක්ෂේත්‍ර, සුදුසු උපාය මාර්ග සහ ප්‍රචාරක මෙවලම් හඳුනා ගැනීම ඇතුළුව, තිරසාර උද්දේශන කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරමින්, නව මාධ්‍ය සහ සමාජ මාධ්‍ය කෙරෙහි අවධාරණය කිරීමක් සිදු කරමින් අධීක්ෂණ,ඇගයීම් සහ තක්සේරු ක්‍රමවේද ද ආවරණය කරන ලදි.

ස්ත්‍රීවාදී වටිනාකම් සමඟ බැඳී ඇති අන්තර්කරණය සහ සහභාගීත්වය කෙරෙහි අවධානයක් සහිතව සංවර්ධනය කරන ලද ස්ත්‍රීවාදී මූලධර්ම හා ප්‍රවේශයන් තුළ වැඩි වශයෙන්ම පිහිටා ධාරිතා වර්ධනය සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදු විය.



හවුල්කාර කාන්තා සංවිධාන සඳහා පවත්වන ලද යෝජනා ලිවීමේ වැඩමුළුව

## කාන්තා සංවිධානවල ධාරිතා වර්ධනය සඳහා වන ප්‍රධාන ප්‍රවේශ

### ඒකාබද්ධ සහ පුද්ගලානුබද්ධ ධාරිතා ගොඩනැගීම

බහු වාර්ෂික අරමුදල් සහිත පාර්ශ්වකරුවන්, ක්ෂණික ප්‍රතිචාර පාර්ශ්වකරුවන් සහ ව්‍යාපෘතියෙන් කිසිදු අරමුදල් ආධාරයක් නොලබමින් සහභාගී වීමට උනන්දුවක් දක්වන තැනැත්තන් ඇතුළුව සියලුම පාර්ශ්වකාර කාන්තා සංවිධානවලට ඒකාබද්ධ ධාරිතා වර්ධන වැඩසටහන් විවෘත විය. සේවා සැපයීම, නායකත්වය, උද්දේශනය, ආයතනික කළමනාකරණය සහ අරමුදල් රැස් කිරීම සහ ආයතනික සංවර්ධනය වැනි ස්තිරසාර ප්‍රවේශයන් පිළිබඳ තාක්ෂණික දැනුම ඇතුළත්ව මාතෘකා පෙළක් සහ කුසලතා සංවර්ධන මාලාවක් ඒකාබද්ධ පුහුණුවෙන් ආවරණය කරන ලදි. ව්‍යාපෘති සංකල්පීකරණය, ආයතනික සහ මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, සන්නිවේදන සහ මාධ්‍ය, ප්‍රතිලාභී ප්‍රජාවන් වර්ධනය, සහ තිරසර උපාය මාර්ග සම්බන්ධයෙන් පාර්ශ්වකාර කාන්තා සංවිධාන සහ කාන්තා අයිතිවාසිකම් සහ කාන්තා සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන අනෙකුත් සංවිධාන වෙත ද සහාය ලබා දෙන ලදි. බොහෝ වැඩසටහන් දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් ලෙස සැලසුම් කර ඇති බැවින් මෙම ඒකාබද්ධ ධාරිතා වර්ධන වැඩසටහන් කාන්තා සංවිධානවලට සමානයන් හා ඉගෙනීමේ අවස්ථාවක් ලබා දෙන ලදි. ඒකාබද්ධ ධාරිතා වර්ධනයෙහි අනපේක්ෂිත ප්‍රතිඵලයක් වූයේ කාන්තා සංවිධාන අතර අවිධිමත් ජාලකරණය වැඩි දියුණු කිරීමට එය වේදිකාවක් සැපයීමයි. ධාරිතා වර්ධන මූලාරම්භයන් සඳහා පාර්ශ්වකාර කාන්තා සංවිධාන මෙන්ම පාර්ශ්වකාර නොවන කාන්තා සංවිධාන වසර ගණනාවක් මුළුල්ලේ එක් කිරීම මගින් විශේෂිත කරුණු සම්බන්ධයෙන් සහයෝගයක් ඇති කිරීමට සහ දැනුම හුවමාරු කිරීමට මං සැලසීය.

ඒකාබද්ධ ධාරිතා ගොඩනැගීමට අමතරව, මෙහෙයුම් ධාරිතා වර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා කාන්තා සංවිධාන විසින් පුද්ගලානුබද්ධ අභ්‍යන්තර පුහුණු (individualized internal training) සංවිධානය කිරීම සඳහා පහසුකම් සැපයීමේ දී ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් පුද්ගලානුබද්ධ ධාරිතා වර්ධන ප්‍රවේශයක් යොදා ගන්නා ලදි. මූලික සැලැස්ම වූයේ මෙම තනි පුද්ගල ධාරිතා වර්ධන සහාය සැපයීමට සහ ගැටලු නිරාකරණය සඳහා උපදේශකයන් යෙදවීමට කාන්තා සංවිධාන වෙත පහසුකම් සැලසීමයි. විශේෂයෙන්ම ස්ත්‍රීවාදී ප්‍රවේශ පිළිබඳ විශේෂඥ දැනුමක් සහිතව, මෙම ආකාරයේ සමස්ථ සහායක් ලබාදීමට සුදුසු පුද්ගලයන්ගේ උග්‍ර හිඟයක් පැවතීම හේතුවෙන් සැලසුම් කළ පරිදි මෙය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙයට පිළියම් සේවීම සඳහා ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් කාන්තා සංවිධානවල අවශ්‍යතා හඳුනාගැනීමට මෙන්ම සහාය සැපයීම සඳහා තාක්ෂණික විශේෂඥයන් හඳුනා ගැනීමට මවුන් සමග සමීප උපදේශනයකින් කටයුතු කරන ලදි. මෙම ප්‍රවේශය කාන්තා සංවිධාන හට සිය අවශ්‍යතා තක්සේරු කිරීමට සහ ඒවාට ප්‍රමුඛත්වය ලබා දීමට මෙන්ම ධාරිතා වර්ධන ප්‍රතිඵල අනුව තාක්ෂණික විශේෂඥයන්ගෙන් ඔවුන් ලබා ගැනීමට අපේක්ෂා කරන දෑ පැහැදිලිව ප්‍රකාශ කිරීමට අවශ්‍ය බල ගැන්වීම ලබා දුනි. ස්ත්‍රීවාදී සංකල්පීය එළඹුම් (feminist conceptual approaches), සහ සම්බන්ධිත සියලු පුද්ගලයන්ගේ සහභාගිත්වය සහ අර්ථදායී නියැලීම ඇතුළත් කිරීම සඳහා වන ක්‍රම සහ දේශීය භාෂා ඔස්සේ සරල ක්‍රමවේද භාවිතය, සහ ක්‍රියාවලිය සහ ප්‍රතිඵල සම්බන්ධයෙන් කාන්තා සංවිධාන සතු හිමිකාරිත්වය ඇතුළුව සෑම ක්‍රියාවලියක් තුළටම ස්ත්‍රීවාදී ක්‍රමවේදී ප්‍රවේශ (feminist methodological approaches) ඇතුළත් කර ඇති බවට ද කාන්තා සංවිධාන විසින් තහවුරු කරන ලදි.

ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියෙන් ඔබ්බට සහ අවශ්‍යතා පැන නගින විට ධාරිතා ගොඩනැගීමට තිරසර ප්‍රවේශයක් සඳහා මග පෑදෙන බැවින් තාක්ෂණික විශේෂඥයන් සමඟ ඇති මෙම සම්බන්ධතා කාන්තා සංවිධානවල ඉදිරි ගමන සඳහා වටිනාකමක් ගෙන දෙනු ඇත. තවද, වඩාත් ක්‍රමානුකූලව සහ සංකල්පීයව මනා

ආකාරයකින් මූලාරම්භයන් හඳුනා ගැනීමට සහ බැහැරින් ලබා ගැනීමට කාන්තා සංවිධානවල ධාරිතා ද වැඩිදියුණු කර ඇත.

## පුද්ගලානුබද්ධ ධාරිතා වර්ධන සහාය වැඩි දියුණු කිරීම සඳහා අවිධිමත් ලෙස රැකියා නියුක්තිකයන් සහය වීම

ව්‍යාපෘතියේ ආරම්භයේ සිටම ධාරිතා වර්ධන ප්‍රවේශයක් වශයෙන් ආරම්භ කරන ලද, අවිධිමත් ලෙස රැකියාව කරගෙන යාමේදී සහයෝගය ලබා දීම එහි කාලසීමාව පුරා පැවති අතර, පාර්ශ්වකාර කාන්තා සංවිධානවල සමස්ත ධාරිතා වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායක විය. ස්ත්‍රීවාදී මූලධර්ම කේන්ද්‍ර කර ගනිමින්, ක්ෂේත්‍ර චාරිකා, දුරකථන සංවාද, මාර්ගගත රැස්වීම් සහ ව්‍යාපෘති යෝජනා, අයවැය සහ ප්‍රතිපත්ති වැනි විවිධ ලේඛන සමාලෝචනය කිරීම සහ සංවර්ධනය කිරීමට සහාය වීම ඇතුළුව මෙම සහයෝගය විවිධ ස්වරූපයන් ගන්නා ලදි.

මෙම ප්‍රවේශය කාන්තා සංවිධාන කළමනාකරණය, මෙහෙයුම්කරණය සහ අරමුදල් රැස්කිරීමේ ධාරිතා ඉහළ නැංවීමේ දී විශේෂයෙන්ම බලපෑම් කරන ලදී දිගුකාලීන ආයතනික ස්ථිරසාරභාවය උදෙසා අරමුදල් රැස්කිරීමේ වැදගත්කම පිළිබඳව කාන්තා සංවිධාන අතර උසස් දැනුම්වත්භාවයක් ඇති වීම සැලකිය යුතු ප්‍රතිඵලයක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපෘති හඳුනාගැනීම, යෝජනා සංවර්ධනය, පරිත්‍යාග ශීලීන්ගේ අන්තර්ක්‍රියා සහ අධීක්ෂණය වැනි ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින් කාන්තා සංවිධාන විසින් ඔවුන්ගේ අරමුදල් රැස්කිරීමේ ධාරිතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘති කණ්ඩායම විසින් රැකියාවේ නියුක්තවීමේ ලබා දෙන ලද සහයෝගය සක්‍රීයව අපේක්ෂා කරන ලදි. කාන්තා සංවිධාන තුළ ශක්තිමත් කළමනාකරණයක් ඇති කරමින්, නව අරමුදල් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ ශක්‍යතාව සහිත මූල්‍ය සහ මෙහෙයුම් පද්ධති ස්ථාපිත කිරීමට සහාය දැක්වීමේ දී මෙම ප්‍රවේශය ඉතා වැදගත් විය.

විවෘත සාකච්ඡා සහ සහබද්ධ ගැටළු විසඳීම මගින් මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම, කාර්ය මණ්ඩල ධාරිතා වැඩිදියුණු කිරීම, ව්‍යාපෘති මැදිහත්වීම් අනුගත කිරීම, සහ මනා පරිචයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බුද්ධිමත් තීරණ ගැනීමට පාර්ශ්වකරුවන් බලගන්වන ලදි. බිම් මට්ටමේ යථාර්ථයන් සම්බන්ධයෙන් අන්තර්දෘෂ්ටි සපයා දෙමින් සහ පාර්ශ්වකාර කාන්තා සංවිධාන වෙත ලබා දෙන තාක්ෂණික සහාය වැඩි දියුණු කරමින්. මෙම බැඳියාව මගින් ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය වෙතටද ප්‍රතිලාභ අත් කර දුනි.

> කාන්තා සංවිධාන සඳහා උපදේශනය සැපයීම සාමාන්‍යයෙන් තාක්ෂණික යෙදවුම් සැපයීමට වඩා ඔබ්බට යයි. සමහරුන්ට, එය ඔවුන්ගේ සමස්ථ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සමාලෝචනය කිරීමේදී සහාය ලබා ගැනීමට අදාළ වීම හෝ ඒවායේ ප්‍රතිඵල අත්පත් කර ගැනීම සහ අර්ථ දැක්වීමට අදාළ වේ; එමෙන්ම තවත් සමහර අයට, එය සංවිධානාත්මක බල ගතිකත්වයන් කළමනාකරණය කිරීම පිළිබඳ තෙවන පාර්ශ්වයක මතය විමසීමක් විය හැකිය. උපදේශක භූමිකාව අපට අපගේ ස්ථාවරය, භූමිකා, සීමා මායිම් සහ බහුවිධ අනන්‍යතා ගැන ආවර්ජනය කර බැලීමට; සහ විශ්වාසය, මිත්‍රශීලීත්වය සහ සහෝදරීත්වය ආරක්ෂා කරමින් පරායත්තතාව අවම කිරීමට සවිඥානික ප්‍රයත්න දැරීමට අවස්ථාව සලසා දේ.
>
> ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ තාක්ෂණික කමිටු සාමාජික ශ්‍යාමලා සිවගුරුනාදන්



වවුනියාව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය කාන්තා සංසද කාර්යාලයට ක්ෂේත්‍ර චාරිකාවක්

**බල ගතිකයන් ආමන්ත්‍රණය කිරීම සඳහා බලගැන්වීමේ ප්‍රවේශය**

ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘති කණ්ඩායම විසින් ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය සහ පාර්ශ්වකාර කාන්තා සංවිධාන අතර දායක-ප්‍රදානලාභී බල ගතිකයන් (donor-recipient power dynamics) ගැන සැලකිලිමත් වූ අතර එය ආමන්ත්‍රණය කිරීම සඳහා සහභාගී වීමේ සහ සවිබල ගැන්වීමේ ස්ත්‍රීවාදී මූලධර්ම අනුගමනය කරන ලදි. මෙම ප්‍රස්ථාපනය තුළ ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මධ්‍යස්ථ අස්තිත්වයක් ලෙස ස්ථාපිත වූ අතර පාර්ශ්වකාර කාන්තා සංවිධාන සඳහා ඔවුන්ගේ අභියෝග විවෘතව සාකච්ඡා කිරීමට සහ විසඳුම් සෙවීමේදී සහාය ලබා ගැනීමට ආරක්ෂිත, නම්‍යශීලී වටපිටාවක් ද ස්ථාපිත කරන ලදි. සමාන හවුල්කාරිත්වයක යන ආකල්පය යටතේ වැඩසටහන් කළමනාකරණය සහ මෙහෙයුම් පරිචයන් හි දී සහාය ලබා ගැනීමට කාන්තා සංවිධාන සතු උනන්දුව සහ කැමැත්ත ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් අඛණ්ඩව සහ පැහැදිලිව අපේක්ෂා කළ අතර, එමඟින් ඔවුන්ගේ ස්වාධීනත්වයට සහ පෞද්ගලිකත්වයට ගරු කරන ලදි.

උපදේශකයන් හඳුනා ගැනීම, තෝරා ගැනීම, ඔවුන්ට විස්තර සැපයීම සහ ඔවුන් සමග ගිවිසුම්ගත වීමේ දී කාන්තා සංවිධානවල සක්‍රීය  සම්බන්ධ වීම මගින් සිය හිමිකාරිත්වය සහ උනන්දුව ආදර්ශනය කළ අතර, තීරණ ගැනීමේ ක්‍රියාවලීන් හි ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයට පහසුකම් සැපයීය. මෙම ප්‍රවේශය මගින් කාන්තා සංවිධානවල සිය අවශ්‍යතා හඳුනා ගැනීමට සහ විසඳුම් සෙවීමට ඇති ධාරිතා ඉහළ නැංවීම මගින් දිගුකාලීන ස්ථිරසාරභාවය සඳහා දායකත්වය දැක්වීම පමණක් නොව, ස්ත්‍රීවාදී ක්‍රමවේදී ප්‍රවේශ අන්තර්ගත කිරීම සඳහා වන ඔවුන්ගේ හැකියාව ඔප් නැංවීම ද සිදු කෙරිණි.

**සන්දර්භීය වෙනස්කම් ආමන්ත්‍රණය කිරීම සඳහා වර්ධනය වෙමින් පවතින ප්‍රවේශ**

සන්දර්භීය වෙනස්කම්වලට අනුගත වීම සහ අවශ්‍යතා වෙනස් කිරීම, ධාරිතා වර්ධන සංරචකයන් හි අදාළ වීම කෙරෙහි සහ ක්‍රියාකාරී වීම සඳහා ප්‍රධාන වේ. ධාරිතා වර්ධන සැලැස්ම මගින් ශක්තිමත් රාමුවක් සැපයූ අතර, වෙනස්වන සන්දර්භයට සහ කාන්තා සංවිධානවල සහ ඔවුන්ගේ ආධාරක කණ්ඩායම්වල ප්‍රමුඛතාවයන්ට අනුගතවීමට ව්‍යාපෘති කණ්ඩායමට බල කෙරෙමින්, කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය විසින් ධාරිතා වර්ධන සැලැස්ම රේඛීයව ක්‍රියාත්මක කිරීමේ දී අභියෝග මතු කරන ලදි.

පළමු ප්‍රධාන වෙනස වූයේ ධාරිතා වර්ධන ලබා දීමේ දී මාර්ගගතව හෝ දෙමුහුන් ක්‍රමවේදයක් මගින් (කොටසක් මාර්ගගතව/ කොටසක් භෞතික ආකාරයෙන්) වැඩ කිරීම සඳහා වූ අවශ්‍යතාවයයි. මෙම වෙනස ඇති කිරීම සඳහා ඩිජිටල් උපකරණ සහ පුහුණුව සැපයීමට ව්‍යාපෘතියෙන් ප්‍රතිපාදන සැලසීමට සිදු වූ අතර, එය විශාල කාර්ය මණ්ඩලයක් අත්කර ගැනීමට උපකාරී වූවා මෙන්ම (අඩු වූ ගමන් වියදම සහ එකම ආකාරයේ මාර්ගගත සැසි සඳහා වැඩි පිරිසකට සම්බන්ධ වීමේ හැකියාව කරුණු කොට ගෙන) පුළුල් සහ සාරවත් විෂය අන්තර්ගතයක් ආවරණය කිරීමට ඉඩ සැලසීය (අමතර පිරිවැයකින් තොරව සහ කාල කාර්යක්ෂම යෙදවිය හැකි පරිදි මාර්ගගත සැසි කිහිපයක් පැවැත්වීමේ හැකියාව කරණ කොට ගෙන).

දෙවන වෙනස වූයේ ධාරිතා මුලපිරීම් ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සම්බන්ධයෙනි. කාන්තා සංවිධානයන්හි විවිධ මට්ටමේ දැනුම සහ කාන්තා සංවිධාන සතු අවබෝධය හේතුවෙන්, ශ්‍රී ලාංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘති කණ්ඩායමට ධාරිතා ගොඩනැගීම් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යොදා ගැනීමට සිදු විය. වඩාත් සවිස්තරාත්මක සැසි සැලසුම් කිරීමට, අමතර නිපුණතා පුහුණුවීම් ලබා දීමට, ශාරීරික පුහුණුව පැවැත්වීමට පෙර පූර්ව සැසි කිහිපයක් පැවැත්වීමට සහ ධාරිතා වර්ධන මුලපිරීම් සඳහා ප්‍රායෝගික සංරචක අන්තර්ගත කිරීම සඳහා කණ්ඩායමට බලකිරීම් සිදු කරන ලදි.

තෙවන වෙනස ධාරිතා වර්ධන සහාය ලබා දීම උදෙසා, අවශ්‍ය කෙරෙන භාෂා හැකියාව සහිත සහ ගෙවන මුදලට වටිනාකමක් සහිත, කාන්තා සංවිධාන පිහිටි පළාත්වලින්ම, ස්ත්‍රීවාදී වැඩසටහන්කරණය සහ තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් මිශ්‍ර අත්දැකීම් සහිත පුහුණුකරුවන්, සම්පත්දායක පුද්ගලයන් සහ උපදේශකයන් ලබා ගැනීම සම්බන්ධයෙන් ඇති විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය එහිම කාර්ය මණ්ඩලයෙන් අභ්‍යන්තර පුහුණුකරුවන් සහ උපදේශකයන් ලබා ගෙන ඔවුන්ගේ සංවර්ධනයන් සිදු කර ඇති අතර, ව්‍යාපෘති කමිටු (තේරීම් කමිටු සහ තාක්ෂණික කමිටු මගින්) සහ දැනට සිටින උපදේශකයන් සහ කාන්තා සංවිධානවලට සහයෝගය ලබා දී ඇති සම්පත්දායක පුද්ගලයන් සමග පවතින තිරසර සම්බන්ධතා මගින් මෙම ව්‍යාපෘතියෙන් පසුව ද මෙම සහාය අඛණ්ඩව ලබා දෙනු ඇති බව පෙනේ.

මෙම ප්‍රවේශය භාවිතා කරමින් පාර්ශ්වකාර කාන්තා සංවිධානවල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා වන ධාරිතා වර්ධන මූලාරම්භයන් සැලසුම් කිරීම සහ සකස් කිරීම සඳහා සැලකිය යුතු කාලයක ආයෝජනයක් අවශ්‍ය විය. සම්ප්‍රයුක්ත ධාරිතා වර්ධන ක්‍රියාවලිය අභියෝගාත්මක වසංගත සහ ආර්ථික අර්බුදකාරී සන්දර්භය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාවේ අවශ්‍යතාවයකින් නිර්මාණය වුවද ව්‍යාපෘතිය සඳහා අනුගමනය කරන ලද එකී සම්ප්‍රයුක්ත ධාරිතා වර්ධන ක්‍රියාවලිය ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය සඳහා අධ්‍යනයක් වූ අතර එය ව්‍යාපෘතියේ මනා පරිචයක් ලෙස සැලකේ.

**දිගුකාලීන ආයතනික ස්ථිරසාරභාවය සහ හිමිකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර ධාරිතා වර්ධනය ව්‍යාපෘති ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කිරීම**

කාන්තා සංවිධානවල දිගුකාලීන ස්ථිරසාරභාවය සහ හිමිකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලක් වශයෙන් දිගු කාලීන ශක්‍යතා සහ සම්පත් සමගින් එම සංවිධාන සවිබල ගන්වමින් ඔවුන්ගේ ආයතනික කළමනාකරණ සහ මෙහෙයුම් ධාරිතා අවශ්‍යතා හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති සමග ඒවා ඒකාබද්ධ කිරීමට එම සංවිධාන දිරිමත් කරන ලදි. සංවිධානාත්මකව ශක්තිමත් කිරීම උදෙසා දරනු ලබන ප්‍රයත්නයන්ට වඩා පූර්ව නිශ්චිතයකින් යුතුව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා පරිත්‍යාගශීලීන් විසින් අරමුදල් සපයනු ලබන මෙම ප්‍රවේශය පොදු ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයකි. ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක, ඔවුන් විසින් සිදු කරනු ලබන විශේෂිත ක්‍රියාකාරකම් වශයෙන්, ඔවුන්ගේ ආයතනික ධාරිතා ගොඩනැගීමේ අවශ්‍යතා ඒකාබද්ධ කිරීමට ඒවායේ හවුල්කරුවන් වෙත අවකාශය සලසා දීම මගින් කාන්තා සංවිධානවල ධාරිතා පොදු සහ විශේෂිත අංග වශයෙන් ආයතනික ක්‍රියාකාරිත්වයේ දී වැඩි දියුණු කරන ලදි.

ආයතනික ක්‍රියාකාරිත්වයේ පොදු අංග වශයෙන් ආයතනික ක්‍රමෝපාය සැලසුම් සංවර්ධනය, ආයතනික අරමුදල් රැස්කිරීමේ ක්‍රමෝපාය මාර්ග, මූල්‍ය හා පරිපාලන අත්පොත් ඇතුළු මූල්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, විවිධ මෙහෙයුම් සහ පරිපාලන මෙවලම්, ආයතනික ව්‍යවස්ථා සංශෝධන, ප්‍රතිඵල වාර්තාකරණ පද්ධති, අවදානම් කළමනාකරණ සැලසුම්, පරිගණක වැඩසටහන් සඳහා ස්ත්‍රීවාදී න්‍යායන් සහ මූලධර්ම ඇතුළත් කිරීමේ මෙවලම්, පරිපාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සමාලෝචන සහ සංශෝධන, දත්ත පදනම් සංවර්ධනය, කාර්ය මණ්ඩලය සඳහා රැකියා අවස්ථා සංවර්ධනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්ති, හිංසන විරෝධී ප්‍රතිපත්ති, මෙහෙයුම් සහ වැඩසටහන් සඳහා ආයතනික තක්සේරු කිරීම්, ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සහ දෘශ්‍යකරණය හා උද්දේශනය සඳහා තොරතුරු තාක්ෂණය සහ සමාජ මාධ්‍ය ඇතුළු උද්දේශන පද්ධති හා උද්දේශන මූලාරම්භ සඳහා ජංගම දුරකථන භාවිත කරමින් වීඩියෝ රූපරාමු නිර්මාණය කිරීම ඇතුළත් වේ.

ආයතනික ක්‍රියාකාරිත්වයේ විශේෂිත මැදිහත්වීම් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධන සැලසුම්, කළමනාකරණ පද්ධති සඳහා කාර්ය මණ්ඩල පරිගණක කුසලතා සංවර්ධනය, කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වලට මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම පවත්වා ගෙන යාම සඳහා උපකාරී වන කළමනාකරණ ආධාරක පද්ධති, රජයේ රාජ්‍ය නොවන සංවිධානවල ලේකම් කාර්යාලය සමග ආයතනික ලියාපදිංචි කිරීම් (අවශ්‍ය සියලුම නීතිමය සහ අනෙකුත් ලියකියවිලි ඇතුළුව) සඳහා උපකාරී වීම, කාන්තා සංවිධානවල අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සමාජිකයන් තෝරා ගැනීමේ දී ප්‍රජා නියෝජනයක් ඇතුළත් කිරීමට උපකාරී වීම, වාණිජ ලිංගික ශ්‍රමිකයන් සඳහා නිර්මිත උපකාරක සැලැස්මක්, මිත්‍රත්වය සහ නීතිමය සහාය පිළිබඳ තක්සේරුවක්. දැනට පවතින පුස්තකාල පද්ධති නව තාක්ෂණික පද්ධති වශයෙන් යාවත්කාලීන කිරීම, පහසුකම් සපයන්නන්ගේ ධාරිතා ගොඩනැගීම සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඔවුන්ගේ නියමිත කටයුත්තට අදාළ ක්‍රියාවලිය ලේඛනගත කිරීම, පුද්ගලික නීති ප්‍රතිසංස්කරණ සඳහා උපදේශන දායකත්වය පිළිබඳ ආයතනික තක්සේරුවක්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සඳහා අදාළ සිද්ධි කළමනාකරණය සඳහා ඩිජිටල්කරණය කරන ලද දත්ත ගබඩාවක්, වාණිජ ලිංගික ශ්‍රමිකයන් වෙනුවෙන් නිර්මිත මධ්‍යස්ථානයක් සඳහා ගොඩවැදීමේ මධ්‍යස්ථාන උදෙසා සකස් කරන ලද මාර්ගෝපදේශ සහ දත්ත ගබඩාවක් වැඩි දියුණු කිරීම, සංවිධාන සඳහා නිර්මිත වෙබ් අඩවි වැඩි දියුණු කිරීම, ක්ෂුද්‍ර ණය වැඩසටහන් සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් සහ කම්කරු අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාත්මක වන කාන්තා

සංවිධානවල එකතුවක් නිර්මාණය කිරීම සඳහා කම්කරු අයිතිවාසිකම් නඩු පිළිබඳ සිදු කරන ලද තක්සේරු කිරීමක් ඇතුළත් වේ.

මෙම ප්‍රවේශය මගින් කාන්තා සංවිධානවල කාර්ය මණ්ඩලය සඳහා ඉගෙනීම ව්‍යාප්ත කිරීමට පහසුකම් සලසා දෙමින් ආයතනය තුළ ධාරිතා රඳවා තබා ගැනීම තහවුරු කරන ලදි. කාන්තා සංවිධානවලට මෙම මූලික ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමට අවකාශය සලසා දීම තුළින් ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියෙන් ඔබ්බට ඔවුන්ගේ දිගුකාලීන ස්ථිරසාරභාවය උදෙසා දායක වීමට හැකි වූ අතර කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ඉදිරියට ගෙන යාම සඳහා දායකත්වය වැඩි දියුණු කිරීම ද සිදු කරන ලදි. පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත ව්‍යාපෘති සහ යාන්ත්‍රණ තුළ එවැනි ධාරිතා වර්ධනයේ ප්‍රයත්න වැඩි වන ආකාරයේ ඒකාබද්ධ කිරීම මගින් ප්‍රත්‍යක්ෂ වූ මෙහෙයුම් ධාරිතා වර්ධනයේ වැදගත්කම පිළිබඳ පිළිගැනීමක් පරිත්‍යාගශීලීන් අතර ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් නිරීක්ෂණය කරන ලදි.

මෙහිදී මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය සඳහා ලබා දුන් දායකත්වය විශේෂත්වයක් ගනී. සංවිධානය පවත්වා ගෙන යාම සඳහා එයට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදු වූයේ එය සතු වූ සීමිත පරිපාලන පද්ධතිය හේතුවෙනි; එහි ප්‍රතිඵලයක් වශයෙන් සන්නිවේදන ගැටලු අධික ලෙස ව්‍යාප්ත වූ වගකීම්, නොපැහැදිලි කාර්යයන්, ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුප සහ කුසලතා සංවර්ධනයේ ඌණතා වැනි තත්ත්ව ඇති විය. මුස්ලිම් නීති ප්‍රතිසංස්කරණය කිරීමට යොදා ගත් අයිතීන් මත පදනම් වූ ප්‍රගතිශීලී උද්දේශන  ප්‍රවේශ හේතුවෙන් එම සංවිධානය මුහුණ දෙන ලද ප්‍රජා පසුබෑමෙන් ඇති වූ ආතතියෙන් හෙබි බාහිර පරිසර තත්ත්ව මගින් මෙම අභියෝග  තීව්‍ර  විය. මෙය මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය විසින් මුහුණ දෙනු ලැබූ කළමනාකාරිත්ව සහ මෙහෙයුම්කරණ සීමා තවදුරටත් සංකීර්ණ කළ අතර, එහි කාර්ය මණ්ඩලයේ පුද්ගලික යහපැවැත්මට ද බලපෑම් ඇති කරන ලදි. ශ්‍රී  ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ සහ බාහිර උපදේශකයෙකුගේ උපකාරයෙන්, එම සංවිධානයට එහි නිශ්චිත අභියෝග හඳුනා ගැනීමට හැකි විය. ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් අනුග්‍රහය දක්වන ලද ව්‍යාපෘතියට යම් නිශ්චිත ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම තුළින්, ඵලදායී පරිපාලන ප්‍රතිපත්ති සහ උපකරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය සමත් විය. එයට අමතරව, ඔවුන් තම කාර්ය මණ්ඩලයේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කරන ලදි, ඔවුන්ගේ සේවා වැඩි දියුණු කරන ලදි, දත්ත එක් රැස්කිරීම් සහ ලේඛනගත කිරීමේ ක්‍රියාවලි නැවත සකස් කරන ලදි,  වාර්තාකරණ යාන්ත්‍රණ වැඩි දියුණු කරන ලද අතර වැඩසටහන් අධීක්ෂණය සහ ඇගයීම ද ශක්තිමත් කරන ලදි. එමෙන්ම, ප්‍රජා පසුබෑමේ පීඩනය හේතුවෙන් ඇති වූ ආතතිය කළමනාකරණය කිරීම සඳහා එම සංවිධානය විසින් සිය කාර්ය මණ්ඩලයට සහාය ලබා දෙන ලදි. සංවිධානයේ කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද කැපවීම සහ උද්යෝගය සමග මුසු වූ ශක්තිමත් නායකත්වයෙන් යුතු මෙකී සහාය මගින් මුස්ලිම් කාන්තා සංවර්ධන භාරයේ ආයතනික කළමනාකාරිත්වය සහ මෙහෙයුම් ධාරිතා වැඩිදියුණු කෙරුණි.

"

මගේ සංවිධානයට සහ මට කිසි විටෙක තනිකමක් දැනුනේ නෑ; දිවයින පුරා විසිරී සිටින සහයෝගය දක්වන සහෝදරියන් සමූහයකට අපව සම්බන්ධ වී ඇත යන කාරණය අපව බල ගන්වන ලදි"

"

(මුස්ලිම් කාන්තා සංවර්ධන භාරයේ විධායක අධ්‍යක්ෂ ජුවයිරියා මොහිදීන්, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය සහ දිවයින පුරා ව්‍යාප්ත ඒ හා සමාන අදහස් ඇති අනෙකුත් සංවිධාන මගින් දක්වන ලද සහයෝගය පිළිබඳ ඇයගේ අදහස් ඉදිරිපත් කරමින්)

එවැනි අනෙකුත් උදාහරණ අතර, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මගින් සහයෝගය දක්වන ලද ව්‍යාපෘතිවලට ගාල්ල දිස්ත්‍රික්කයේ ගැමි කාන්තා පෙරමුණ විසින් ද කළමනාකරණ සහ මෙහෙයුම්කරණ සහාය ඒකාබද්ධ කරන ලදි.

> ආසියා පදනමෙහි ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය අප සංවිධානය යළි නගා සිටුවීමේ සන්ධිස්ථානයක් විය. උපායමාර්ගික සැලසුම් සකස් කිරීම පිළිබඳ වැඩමුළුව අපගේ ගමන් මාර්ගය ආවර්ජනය කිරීමට උපකාරී වූ අතර සංවිධානය යළි නගා සිටීමට අවශ්‍ය ශක්තිය සහ දැක්ම අප වෙත ලබා දෙන ලදි. අප දැන් රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර අපගේ ව්‍යවස්ථාව සංශෝධනය කර, පසුගිය වසර කිහිපය තුළ දී සහභාගීත්වයේ පැවති අඩුපාඩු හේතුවෙන් නිසි ලෙස ක්‍රියාත්මක නොවූ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීමේ අරමුණින් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීමට දැනටමත් සැලසුම් කර ඇත්තෙමු.
>
> ගාල්ල දිස්ත්‍රිකයේ ගැමි කාන්තා පෙරමුණේ සභාපති ශ්‍රියානි පතිරගේ

### ධාරිතා වර්ධනය කිරීමේ ප්‍රවේශයක් වශයෙන් විවේචනාත්මක දැක්ම දිරිමත් කිරීම

ඒකාබද්ධ ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන් මගින් ඒ සඳහා සහභාගිවන්නන් තුළ ඔවුන්ගේ ගැඹුරු අභ්‍යන්තරීකරණය ප්‍රවර්ධනය කරමින්, සංකල්පමය මාතෘකා විමර්ශනය කිරීම සඳහා විවේචනාත්මක දැක්මක් භාවිත කරන ලදී. මෙය කාන්තා සංවිධාන සඳහා ස්ත්‍රීවාදී සංකල්ප, මූලධර්ම සහ ප්‍රවේශ පිළිබඳව අධ්‍යයනය කිරීමට විශේෂයෙන්ම ඵලදායී විය. දේශන ශෛලීය මෙන් නොව මෙම ප්‍රවේශය මගින් කාන්තා සංවිධාන ස්ත්‍රීවාදී සංකල්ප, මූලධර්ම, න්‍යායයන් සහ ප්‍රවේශ සම්බන්ධයෙන් දැනටමත් ඔවුන් 'සිදු කරන' සහ 'දන්නා දේ' සමග ගලපා ගැනීමට ඔවුන්ට මග පෙන්වීම කර ඉගෙනුම් ඵල වැඩිදියුණු කිරීමට ප්‍රායෝගික දැනුම සමග විවේචනය සහ විශ්ලේෂණය සංයෝග කෙරුණි. ධාරිතා වර්ධනය කිරීමේ වැඩමුළු මාලාවන් ව්‍යාපෘතිකරණය සඳහා ස්ත්‍රීවාදී ප්‍රවේශ සහ ස්ත්‍රීවාදී අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනීම පිළිබඳ වැඩමුළුවල දී විශේෂයෙන්ම මෙම ප්‍රවේශය භාවිත කරන ලදි. ප්‍රවීණයන් විසින් හෝ ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘති කණ්ඩායමේ රැකියා උපදේශකත්වය මගින් සිදු කරනු ලබන තනි ආයතන ධාරිතා වර්ධනය යනු කාන්තා සංවිධාන තාර්කික විවේචනය කෙරෙහි දිරිමත් කෙරුණු ස්ත්‍රීවාදී වටිනාකම් සහ මූලධර්ම වැඩසටහන්කරණයට සහ ආයතනික පාලනයට අන්තර්ගත කිරීම උදෙසා කාන්තා සංවිධානවල ධාරිතා වැඩිදියුණු කෙරුණු තවත් එක් ආකාරයකි.

කාන්තා සංවිධාන සඳහා ඔවුන්ගේ ම සන්දර්භ තුළ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන්කරණයේ දී මතු වන ගැටලු සහ අඩුපාඩු හඳුනා ගැනීමටත්, ඔවුන්ගේ සම්පත් උපරිම කර ගනිමින්, තාක්ෂණික විශේෂඥයන් සමඟ සම්බන්ධ වෙමින්, අවශ්‍ය අයවැය ලේඛන කෙටුම්පත් කරමින්, කාන්තා අයිතිවාසිකම් සංකල්ප පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වඩා ශක්තිමත් කිරීමටත් සහ ස්ත්‍රීවාදී ප්‍රවේශ වශයෙන් වැඩසටහන් ප්‍රවේශ සඳහා සංකල්පගත වීම සිදු කරනු ලබන්නේ කෙසේ දැයි සිතීම ආරම්භ කිරීමටත් මෙම ප්‍රවේශය මගින් පහසුකම් සලසා ඇත. ස්ත්‍රීවාදී කටයුතු ක්‍රියාත්මක කරනු ලබන ස්ත්‍රීවාදී සංවිධාන වශයෙන් කාන්තා සංවිධානවලට ඔවුන්ගේ ඒකීය-අනන්‍යතාව සඳහා දායක වන පුද්ගල පක්ෂක්ග්‍රාහිත්වය, අත්දැකීම් සහ බල ගතිකත්වය ඔවුන් විසින් ම පරීක්ෂා කර ගැනීමට හැකි වූ පරිද්දෙන් විවේචනය සඳහා අවකාශයක් ද මෙම ප්‍රවේශය තුළින් නිර්මාණය කෙරිණ.

**සමගාමීන් හා ඉගෙනුම් ප්‍රවේශය**

ප්‍රජා සහභාගීත්වය සහ සාර්ථක මැදිහත්වීමක් කෙරෙහි ඵලදායී උපාය මාර්ග සංවර්ධනය කිරීමේ පුළුල් දැනුමක් සහ පළපුරුද්දක් සම්බන්ධයෙන් කීර්තිමත් ඉතිහාසයක් කාන්තා සංවිධාන සතු වේ. ප්‍රජා සාමාජිකයන් සමඟ දිගුකාලීන සබඳතා ගොඩනඟා ගැනීම, රාජ්‍ය නිලධාරීන් සහ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සමග හවුල්කාරීත්වයක් ඇති කර ගැනීම සහ සමාජීය වශයෙන් බැහැර කරන ලද කණ්ඩායම් සමාජ ගත කිරීම සහතික කිරීම සඳහා වැඩසටහන්කරණයට "අන්තර්ඡේදන දැක්මක්" ඒකාබද්ධ කිරීම මෙයට ඇතුළත් වේ. මෙය වාසි සහගත ලෙස ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මගින් කාන්තා සංවිධාන සඳහා ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් අනෙකුත් කාන්තා සංවිධාන සමඟ බෙදා ගැනීමට විවිධ වේදිකාවන් නිර්මාණය කරන ලදි.

ඒකාබද්ධ ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන් තුළ දී කාන්තා සංවිධාන විසින් තම පුළුල් විශේෂඥ දැනුම කණ්ඩායම් සාකච්ඡා සහ ඉදිරිපත් කිරීම් හරහා සක්‍රියව ලබා දෙන ලදි. සමාජීය වශයෙන් බැහැර කරන ලද කණ්ඩායම් සමග එක්ව ක්‍රියා කරනු ලබන කාන්තා සංවිධානවල විශේෂඥයන්ට ඔවුන්ගේ අත්දැකීම් ආශ්‍රිතව ලබාගත් දැනුම බෙදා ගැනීමට සහ ඵලදායි වැඩසටහන් සඳහා උපාය මාර්ග සොයා බැලීමට ආරාධනා කිරීම තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ සමාජ අන්තර්කරණය පිළිබඳ වැඩමුළුව සම්පූර්ණයෙන්ම කාන්තා සංවිධාන මත පදනම් වීම විශේෂයෙන්ම අවධාරණයට ලක් විය. බොහෝ කාන්තා සංවිධාන මගින් ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් ඔවුන්ගේ ප්‍රමුඛතා වශයෙන් ඇතුළත් කර ගැනීම සහතික කර ගනිමින් අන්තර්ඡේදන ප්‍රවේශයක් යොදා ගැනීම ආරම්භ කළ බැවින් ප්‍රතිඵල ධනාත්මක විය.

LGBTQIA+ ප්‍රජාව (සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික හා අවිනිශ්චිත අනන්‍යතාවන් සහිත ප්‍රජාව) අපගේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවන බැවින් එහි කෙටුම්පත සංශෝධනය කිරීමට අපට උවමනායි. වැඩමුළුවෙන් පසුව ඔවුන්ව [LGBTQIA+ ප්‍රජාව] නොසලකා හැර ඇති බව අපට වැටහුණු නිසා එම ප්‍රජාව අපගේ සංවිධානයේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට අපි කැමැත්තෙමු. සංක්‍රාන්ති ලිංගික දරුවන් පාසල හැර යාමේ අවදානමක සිටින බව අපට වැටහුණා. අපේ කටයුතුවල දී එවැනි අවස්ථා අපට බහුලව දක්නට ලැබෙනවා. උදාහරණයක් වශයෙන්, ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී, අනන්‍යතාවට සහ ප්‍රකාශනයට ගැළපෙන ඇඳුම් ඇඳීමට අවසර දී නොතිබූ බැවින් දරුවෙකු නැවත පාසල් යැවීමට අපි උදව් කළා.

(නුවර එළිය එක්සත් ලංකා සුභසාධක පදනම විධායක අධ්‍යක්ෂ මනෝරි තන්ත්‍රිගේ)

කාන්තා සංවිධාන විසින් ධාරිතා ගොඩනැගීම සහ ජාලකරණ වැඩසටහන් ඔවුන්ගේ ව්‍යාපෘති තුළට ගලපා ගැනීම තුළින් ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගන්නා ලදි. නිදසුනක් වශයෙන්,ප්‍රජාව තුළින් කාන්තාවන් බලමුලු ගන්වන සහ ඔවුන්ගේ ආර්ථික සවිබල ගැන්වීම කෙරෙහි සක්‍රියව දායක වන සංවිධානයක් වශයෙන් කාන්තා සංවර්ධන මහා සංගමයේ සාර්ථකත්වය ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ පාර්ශ්වකාර කාන්තා සංවිධාන බොහෝ ප්‍රමාණයකට ඔවුන්ගේ අදාළ ප්‍රජාව තුළ ඒ හා සමාන උපාය මාර්ග යොදා ගැනීමට පෙළඹවීම් සිදු කර ඇත. කාන්තා සංවර්ධන මහා සංගමය විසින් දිස්ත්‍රික්ක කිහිපයක් තුළ කාන්තා සංවිධාන නවයක් සඳහා ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ආධාරක ව්‍යාපෘතිය යටතේ

සංවිධානය කරන ලද ජාලකරණ සහ ඉගෙනුම් අවස්ථාව සාර්ථක වූ අතර, එමගින් ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය සූක්ෂම දෘෂ්ඨියක් සහ යහ භාවිතයන් සපයා දෙමින්, ඉදිරි සන්නිවේදනය කටයතු සඳහා අවස්ථා නිර්මාණය කොට ඉදිරි කාලීන සහයෝගිතාවයන් උදෙසා අඩිතාලම යොදන ලදි.

අපගේ ප්‍රජාවන් තුළ මෙම ඉගෙනුම් හැදෑරීමට සහ ක්‍රියාත්මක කිරීමට විශාල අභිප්‍රේරණයක් අපට දැණුනි. අපේක්ෂා කළ යුතු අභියෝග මොනවා ද සහ ඒවා ආමන්ත්‍රණය කරන්නේ කෙසේ ද යන්න සහ හිතකර ප්‍රතිචාරයක් සහ සහයෝගයක් ලබා ගැනීම සඳහා රජය සමඟ අප සිවිල් සමාජ සංවිධාන වශයෙන් සම්බන්ධ විය යුතු ආකාරය පිළිබඳව අපට වඩා හොඳ අවබෝධයක් පවතී. අපට දැන් පැහැදිලි ආරම්භක් තියෙනවා”

[නුවර එළිය දිස්ත්‍රික්කය සමාජ සුබසාධන පදනම විසින් කාන්තා සංවර්ධන මහා සංගමය සමග ජාලකරණය සහ ක්ෂේත්‍ර පළපුරුද්ද ලබා ගැනීමෙන් අනතුරුව]

එයට සමගාමීව, හදිසි ප්‍රතිචාර අරමුදලේ පාර්ශවකරුවකු වන සමාජ සංවේදී කේන්ද්‍රය, දිස්ත්‍රික්ක 10ක විසිරී සිටින කාන්තා සංවිධාන පාර්ශ්වකරුවන් දස දෙනෙකු සමග සහයෝගීව ක්‍රියා කර “වැඩිහිටි කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ තක්සේරුව” නම් වූ අධ්‍යයනය පැවැත් වූ අතර සාධක මත පදනම් වූ උද්දේශනය කටයුතුවල නියැලිණ. මෙම අධ්‍යනය සමාජ සංවේදී කේන්ද්‍රයේ විශේෂඥ දැනුමේ සහ පර්යේෂණය සඳහා කැපවුණු කාන්තා සංවිධානවල සමීප සහයෝගීත්වයේ ප්‍රතිඵලයකි. සමාජ සංවේදී කේන්ද්‍රය ව්‍යාපෘතිය සදහා ඔවුන්ගේ සහභාගීත්වය තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලීන් තුළ වයස් අන්තර්ගතක තවදුරටත් දියුණු කරමින්, ඔවුන්ගේ කාර්යන් හි දී අයිතිවාසිකම් පදනම් වූ ප්‍රවේශයක් ප්‍රධාන ධාරාවක් ලෙස වයස් අන්තර්ගතකරණය මූල ප්‍රවාහකරණය කිරීමට එම සංවිධාන සතු ධාරිතා වැඩි දියුණු කර ඇත.

දැනුම සහ අත්දැකීම් බෙදාගැනීම ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ කාන්තා සංවිධාන පාර්ශ්වකරුවන්ගෙන් ඔබ්බට ව්‍යාප්ත වී ඇත. කාන්තා සංවිධාන වෙත වෙනත් සංවර්ධන වෘත්තිකයන් සමග ඔවුන්ගේ වැඩසටහන් අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා ආරාධනා කෙරිණ. නිදසුනක් වශයෙන්, කාන්තාවන්ගේ කම්කරු අයිතිවාසිකම් කෙරෙහි කේන්ද්‍රගත වී ඇති කාන්තා සංවිධාන විසින් කොවිඩ්-19 වසංගතය තුළ කාන්තා ශ්‍රමිකයන් විසින් මුහුණ දෙනු ලැබූ අභියෝග විශේෂයෙන් දක්වමින් ඔවුන්ගේ කාර්යයන් ආසියා පදනමේ කාර්ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී මීට අමතරව, පර්යේෂණ හා අධ්‍යාපනය සඳහා වූ ඉස්ලාමීය කාන්තා සංගමය විසින් 2023 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි ක්‍රියාකාරීත්වයේ දින 16ක සැසියක් සංවිධානය කරන ලද අතර එහි දී දෙමළ භාෂාව කථන භාෂාව ලෙස භාවිත කරනු ලබන ප්‍රදේශවල කාන්තා සංවිධාන ප්‍රජා මට්ටමින්



ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ සමාජ අන්තර්කරණය කිරීම් පිළිබඳ වැඩමුළුව

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඔවුන්ගේ මැදිහත්වීම් සහ වළක්වීමේ මූලාරම්භයන් සංවර්ධන වෘත්තිකයන් සහ පරිත්‍යාගශීලීන් සමග හුවමාරු කර ගන්නා ලදි.

## කාන්තා සංවිධානවල දැනුම වර්ධනය කිරීම සඳහා අන්තර් පාරම්පරික ප්‍රවේශය (Intergenerational Approach)

සංවිධානයේ දිගුකාලීන ස්ථිරසාරභාවය උදෙසා බලය හුවමාරු කර ගැනීමට සහ කාන්තා සංවිධානවල තරුණ සාමාජිකයන් වෙත දැනුම ලබා දීම දිරිමත් කිරීම පිණිස, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මගින් සංවිධානය කරන ලද ධාරිතා වර්ධනය කිරීමේ මූලාරම්භ වැඩසටහන් සඳහා තරුණ සාමාජිකයන් (ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමග) වෙත ආරාධනා කිරීමට කාන්තා සංවිධාන දිරිමත් කරන ලදි. සහභාගිවන්නන්හට ඔවුන්ගේ සංවිධාන තුළ දී එම පුහුණුවීම්වලට සමාන පුහුණුවක් ලබා දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරමින් කාන්තාව සහ නීතිය පිළිබඳ ව්‍යාපෘතිය වැනි විශේෂිත ධාරිතා වර්ධනය කිරීමේ මූලාරම්භක වැඩසටහන් පුහුණුකරුවන්, පුහුණු කිරීමේ වැඩමුළු වශයෙන් සැලසුම් කෙරිණි.

තවදුරටත්, කාන්තා සංවිධානවල අභ්‍යන්තරික කේවල ආයතන ධාරිතා වර්ධනය තුළින් පුහුණු වැඩසටහන් සඳහා තරුණ කාර්ය මණ්ඩලය ඇතුළත් කිරීම තහවුරු කෙරිණ. කළමනාකරණ සහ මෙහෙයුම් ධාරිතා වර්ධනය කිරීමට ප්‍රතිපාදන සැලසීම තුළින්,කාන්තා සංවිධානවලට ආයතනික ව්‍යවස්ථා, ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට, හොඳ භාවිතයන් ලේඛනගත කිරීමට හා කාන්තා සංවිධාන තුළ ආධාරක සාමූහික ඉගෙනුම් වශයෙන් පුහුණු අත්පොත් සංවර්ධනය කිරීමට කාන්තා සංවිධානවලට හැකි විය. නිදසුනක් ලෙස අඛණ්ඩ පුහුණුව, උපදේශනය, දැනුම හුවමාරු කරගැනීම, අත්දැකීම්, සම්පත් සහ ආයතනික දැක්මේ පැහැදිලි බව, පවත්වාගෙන යාමට මෙන්ම ප්‍රජාතාන්ත්‍රික ස්ත්‍රීවාදී මූලධර්මයන් නව සාමාජිකයන් වෙත හුවමාරු කිරීම හරහා අන්තර්පාරම්පරික සාමූහික ඉගෙනීමට සහය දැක්වීමට පර්යේෂණ සහ සවිබලගැන්වීම් සඳහා වූ ඉස්ලාමීය කාන්තා සංගමය මගින් නව ව්‍යාපෘති සහ ක්‍රියාකාරීත්වය ඇසුරින් යාන්ත්‍රනයක් ගොඩනගා ඇත.

## අන්තර්කරණ ප්‍රවේශය

ළදරුවන් සමග පැමිණෙන මව්වරුන් වෙත විශේෂ අවධානය යොමු කිරීම, එහි දී මව්වරුන් කැටුව යාම සඳහා රැක බලා ගන්නන් හට අවශ්‍ය සහය ලබා දෙමින් වැඩසටහන් පැවැත්වීම සඳහා ආරක්ෂිත ස්ථාන භාවිත කිරීම, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘති කණ්ඩායම විසින් සෑම පුද්ගලයෙකු කෙරෙහි ම දක්වනු ලබන නොවෙනස් අවධානය තුළින් ආබාධිත පුද්ගලයන්ගේ ප්‍රවේශ සහ ඔවුන්ට අවශ්‍ය සේවා සැපයුම සහතික කිරීම, බොහෝ අවස්ථාවල දී ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින්ම අර්ථකතන සහිතව ප්‍රාදේශීය භාෂාවලින් වැඩසටහන් මෙහෙයවමින් භාෂාමය හැකියා සුරක්ෂිත කිරීමට ද කටයුතු කිරීම, සංක්‍රාන්තක්‍රියාවලියේ මධ්‍ය සංක්‍රාන්තඅවධියේ පසුවන කාන්තාවන්ගේ සහභාගීත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම වැනි මාර්ග ඔස්සේ අන්තර්කරන ප්‍රවේශය භාවිත කරමින් ව්‍යාපෘතිය හරහා එහි සහභාගිවන්නන් දිරිමත් කරන ලදි. ධාරිතා ගොඩනැගීම වෙත සැමටම ළඟා විය හැකි බවට මෙම අන්තර්කරණ ප්‍රවේශය තහවුරු කරන ලදි.

## කාන්තා සංවිධාන සඳහා ධාරිතා වර්ධනයේ සමස්ත ප්‍රතිඵල

කාන්තා සංවිධාන සඳහා ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ ධාරිතා වර්ධනය මගින් ලබා දුන් සහයෝගයේ ප්‍රතිඵල සැලකිය යුතු සහ බහුවිධ වේ. ස්ත්‍රීවාදී ප්‍රවේශ සහ කාන්තා අයිතිවාසිකම්, සංකල්ප පිළිබඳ වැඩි දියුණු වූ අවබෝධය අනුගත කර ගැනිමට මෙහෙයවමින් විස්තීර්ණ ධාරිතා වර්ධනය කිරීමේ මූලාරම්භයන් තුළින්, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය විසින් ස්ත්‍රීවාදයේ වටිනාකම් සහ මූලධර්ම පාර්ශ්වකාර කාන්තා සංවිධානවල මෙහෙයුම් සහ වැඩසටහන්කරණයට සාර්ථකව ඒකාබද්ධ කරන ලදි. මෙම ධාරිතා වර්ධනය, සේවා සැපයීම සහ උද්දේශනය වැඩිදියුණු කිරීම දක්වා ව්‍යාප්ත වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නව සේවා හඳුන්වා දීම, ප්‍රජා ප්‍රවේශය වැඩි කිරීම සහ උද්දේශන වේදිකාවල නියැලෙන අවස්ථා ඉහළ නැංවීම වැනි දෘශ්‍යමාන වර්ධනයන් කෙරෙහි හේතු විය. එමෙන්ම, ප්‍රතිපත්ති සංවර්ධනය සහ නීතිමය ප්‍රතිසංස්කරණ සඳහා කාන්තා සංවිධානවල ක්‍රියාකාරී සහභාගිත්වය බල ගන්වමින් එම සංවිධාන අතර ජාලකරණ සහ උද්දෙශන ධාරිතාවන් වැඩි දියුණු කිරීමෙහිලා ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතිය මගින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදි. වසංගත සහ ආර්ථික අර්බුද වැනි අභියෝග මධ්‍යයේ වුව ද, කාන්තා සංවිධාන ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා දායක වෙමින් කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට අඛණ්ඩව කටයුතු කරන ලදි. සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකා කාන්තා හඬ හා නායකත්ව ව්‍යාපෘතියේ ධාරිතා වර්ධනයේ දී ලබා දුන් සහයෝගය කාන්තා සංවිධාන සවිබල ගැන්වීමේ දී සහ රට තුළ කාන්තා සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය වැඩි දියුණු කිරීමට ඔවුන්ගේ ක්‍රියාමාර්ග සඳහා සහාය වීමේදි උපකාරි වී තිබේ.

In partnership with Canada

The Asia Foundation

**ව්‍යාපෘතිය ගැන:** ශ්‍රී ලංකා කාන්තා හඬ සහ නායකත්ව ව්‍යාපෘතිය, කැනේඩියානු රජයේ අරමුදල් මගින් ආසියා පදනම විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියකි. කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම ආදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන කාන්තා නායකත්වයක් යටතේ පවතින දේශීය කාන්තා අයිතීන් පිළිබඳ කටයුතු කෙරෙන සංවිධානවල ක්‍රියාකාරකම් සඳහා ධාරිතාව වර්ධනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

**මෙම ලේඛනය පිළිබඳ අදහසක්:** ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතියේ සන්නිවේදන උපාය මාර්ගයේ අංගයක් ලෙස ගොඩනගන ලද "ප්‍රවේශය පිළිබඳ සටහන් පත්‍රිකා" නම් වූ විස්තර පත්‍රිකා මාලාව, ව්‍යාපෘති කණ්ඩායම විසින් විවිධ ව්‍යාපෘති අරමුණු ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරන ලද ප්‍රවේශයන්, සාක්ෂාත් කරගත් ප්‍රතිඵල, දැනුම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය අතරතුර උගත් පාඩම් පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. මෙම ලේඛනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟ තුළ ගැඹුරු චින්තනයක් සහිත මාර්ගෝපදේශයක් ලෙස කටයුතු කරන අතර එහි ජයග්‍රහණ හැඩගැස්වීමේදී ස්ත්‍රීවාදී ප්‍රවේශයන්ගේ වැදගත්කම අවධාරනය කරයි.

**කාන්තා හඬ සහ නායකත්වය - ශ්‍රී ලංකාව**
ආසියා පදනම
30/1, බගතලේ පාර, කොළඹ 3.
දුරකථන: +94 11 2058701
විද්‍යුත් තැපෑල: අඩක්ඊස්දෙමබෝඑසදබගදරට